# සාමාන්‍ය සමයේ විසි පස්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 55: 6–9

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි*

"මාගේ සිතුවිලි නුඹේ සිතුවිලි මෙන් නොවේ."

හමු විය හැකි බැවින් සමිඳුන් සොයා යන්න; ළඟ ම සිටිය දී එතුමන් අයදින්න. දුෂ්ඨයා සිය මාර්ගයෙන් හැරී, අදමිටු මිනිසා තම සිතුවිලි දුරලා, සමිඳුන් වෙත ඇදී ඒවා; එතුමන් ඔහුට අනුකම්පා කරනු ඇත. දෙවිඳුන් වෙත හැරී ඒවා! එතුමන් ඔහුට බොහෝ සේ කමා කරනු ඇත. සමිඳාණන් වන මම මෙසේ පවසමි. "මාගේ සිතුවිලි නුඹේ සිතුවිලි මෙන් නොවේ; මාගේ මාර්ග නුඹේ මාර්ග මෙන් නොවේ. අහස පොළොවට වඩා බොහෝ ඉහළින් ඇති සේ නුඹේ මාර්ගවලට වඩා මාගේ මාර්ග උසස් ය. නුඹේ සිතුවිලිවලට වඩා මාගේ සිතුවිලි බොහෝ සේ උසස් ය."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 145: 2–3, 8–9, 17–18

පිළිතුර: අයදින සියල්ලන්ට සමිඳාණෝ ළං වන සේක.

ගීය : මා දෙවි රජිඳුනි, සැමදා ඔබට තුති පුදමි;
සදාකල් ඔබ නම පසසමි.
සමිඳාණෝ උතුම් ය, උසස් ම පැසසුම් ලැබිය යුතු ය.
එතුමන්ගේ උතුම්කම සොයා දැනගත නොහැකි ය.

සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය;
වහා නොකිපෙන සුළු ය, තිරසර පෙමින් යුතු ය.
සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක;
එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ල ද වෙත පැතිරෙයි.

සමිඳාණෝ සැම අතින් ම සාධාරණ ය,
එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය.
අයදින සියල්ලන්ට සමිඳාණෝ ළං ව සිටින සේක.
අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින සේක.

## දෙවන දේව ප්‍රකාශනය පිලිප්පි 1: 20–24, 27

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසක.*

"ජීවත් වීම නම් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත් වීම ය."

මගේ දැඩි බලාපොරොත්තුව හා පැතීම මෙය වේ: මා කිසිවක් ගැන ලජ්ජාවට නොපැමිණ, හැම අයුරෙන් ම නිර්භීත ව සිට, මැරෙතත්, ජීවත් වෙතත්, මාගේ ජීවිතයෙන්, පෙර සේ ම දැනුත් ක්‍රිස්තුන් වහන්සේ මහිමයට පැමිණවීම ය. මට ජීවත් වීම නම්, ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ජීවත් වීම ය. මරණය මට වාසියකි. එහෙත් මිහි පිට ජීවත් වීමෙන් යම් වැඩදායි සේවයක් කළ හැකි නම්, මේ දෙකින් කුමක් තෝරාගන්නට දැයි මම නොදනිමි. මම මේ දෙක මැද හිර වී සිටිමි. මාගේ ආශාව නම් මෙලොවින් තුරන් වී ගොස්, ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසීම ය. මෙය වඩාත් හොඳ ය. එහෙත් ඔබ උදෙසා මිහි පිට විසීම ඊටත් වඩා අවශ්‍ය වේ.

කෙසේ වෙතත්, ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්නට ඔබින ලෙස ම හැසිරෙන්න.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබ වහන්සේගේ පුත්‍රයාණන්ගේ
වචන පිළිගැනීමට අප සිත්
පැහැදුව මැනව.
ආලේලූයා!

## සුවිශේෂය — මතෙව් 20: 1–16

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### “මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා වන්නේ මන්ද?.”

ජේසුස් ස්වාමින් වහන්සේ මෙසේ ද වදාළ සේක: “ස්වර්ග රාජ්‍යය වූකලී තමාගේ මිදි වත්තට කුලීකරුවන් ගන්නා පිණිස එක් දිනක් අළුයම පිටත් ව ගිය ඉඩම් හිමියකුට සමාන ය. ඔහු දිනකට රිදී කාසියක් බැගින් ගෙවීමට කුලීකරුවන්ට පොරොන්දු වී, තමාගේ මිදි වත්තට ඔවුන් යැවී ය. උදේ නවයට පමණ ඔහු පිටත් ව ගොස්, කඩමණ්ඩියේ වැඩක් නැති ව සිටි තවත් අය දැක, ‘ඔබත් මිදි වත්තට යන්න, සෑහෙන කුලියක් ඔබට දෙමි’ යි කී ය. ඔව්හු වැඩට ගියහ. නැවත මද්දහනේ දී ද අපරභාග තුනට පමණ ද ඔහු පිටත් ව ගොස් එසේ ම කළේ ය. සවස පහට පමණ ද පිටත් ව ගොස් එහි තවත් අය සිටිනු දැක, ‘ඔබ මෙතන දවස තිස්සේ නිකම් සිටින්නේ මන්දැ’ යි ඔවුන්ගෙන් ඇසී ය. ‘කිසිවෙකු අප වැඩට නොගත් නිසා ය’යි ඔව්හු කී හ. ‘ඔබත් මිදි වත්තට යන්නැ’යි ඔහු ඔවුන්ට කී ය.

සවස් වූ කල මිදි වත්ත හිමියා සිය කළමණාකාරයාට කතා කොට, ‘කුලීකරුවන් කැඳවා අන්තිමට ආ අයගෙන් පටන් ගෙන පළමු වැන්නා දක්වා ඔවුන් හැමට කුලිය ගෙවන්නැ’යි කී ය. එවිට සවස පහට පමණ වැඩට ආ අය අවුත් එක එක මිනිසා රිදී කාසිය බැගින් ලැබූ හ. මුලින් ම වැඩට ගිය අය ආ විට තමන්ට ඊට වැඩියෙන් ලැබෙනු ඇතැයි සිතූ හ. එහෙත්, ඔව්හු ද එක එක මිනිසා රිදී කාසියක් බැගින් ලැබූ හ. එසේ ලැබූ ඔව්හු ඉඩම් හිමියාට විරුද්ධ ව දොස් කියමින්, ‘මේ අන්තිමට ආ අය වැඩ කළේ එක පැයක් පමණි. එහෙත්, අවු රස්නය නොබලා මුළු දවසේ ම වෙහෙස මහන්සි වූ අපටත් ඔබ රිදී කාසියක කුලිය ම ගෙවන්නෙහි ය’යි කී හ. එහෙත් ඔහු ඔවුන්ගෙන් කෙනෙකුට උත්තර දෙමින්, ‘යහළුව, මා ඔබට අයුත්තක් කරනවා නොවේ. ඔබ මා සමඟ රිදී කාසියක කුලියට එකඟ වුණා නොවේ ද? ඔබට දුන් කුලිය රැගෙන යන්න: ඔබට ගෙවූ ලෙස ම මේ අන්තිමයාටත් ගෙවීම මාගේ කැමැත්ත ය. මා සන්තක දෙයින් මා කැමති දෙයක් කිරීමට මට අයිතියක් තිබෙනවා නොවේ ද? මා කාරුණික බැවින් ඔබ ඊර්ෂ්‍යා වන්නේ මන්දැ’ යි ඇසී ය. මෙසේ අන්තිමයෝ ප්‍රථමයෝ ද ප්‍රථමයෝ අන්තිමයෝ ද වන්නෝ ය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

**සාමාන්‍ය සමයේ 25 වෙනි ඉරුදින - 2017-09-24**
**ජාතික ධර්මෝපදේශ දිනය**

**හැඳින්වීම** : "විශේෂ වරප්‍රසාද නොසොයා දේව රාජ්‍යයේ වර්ධනය සඳහා වෙහෙසෙමු "

දේව ජනතාවක් ලෙස අපි විවිධ තරාතිරම්, විවිධ සේවාවන් හා නිලතල දරමින් සහා සේවාවේ කැපවී සිටින්නෙමු. විවිධ සේවාවන් අප අති සිදුවූවත් ශු.පාවුලු තුමා පවසන ලෙස, සමිඳාණන් වහන්සේ මහිමයට පැමිණවිය හැකි යමක් අප අතින් සිදුකළ හැකි නම්, එය සමිඳුනට ප්‍රසන්න වේ. මෙලොවේදී අප දරා සිටින නිලතල, තරාතිරම් හා අපගේ පරිත්‍යාග, ස්වර්ගීය වරප්‍රසාද ලබාගැනීමට විශේෂ වාසියක් නොවේ. කිතු සමිඳුන් සැමහට එකසේ ප්‍රේම කරන්නාසේ උන්වහන්සේගේ වරප්‍රසාද ද එක සමානවම අප කරා පැමිණේ. එබැවින් අප කරන සේවාවන් තුළ විශේෂ වරප්‍රසාද නොපතා, කිතු සමිඳුන් හඳුනාගන්නට, හඳුනා දෙන්නට හැකි ජීවිතයක් අපි ගොඩනගා ගනිමු. විශේෂයෙන් ජාතික ධර්ම උපදේශක දිනය වන අද දෙවියන් වහන්සේගේ මාර්ගය සොයාගැනීම සඳහා ළමා පරපුරට මඟපෙන්වීමට ඉදිරිපත්වී සිටින අප දහම් ගුරු ගුරුවරියන් සැමට ඔවුන්ට ලැබී තිබෙන එම කැඳවීම තේරුම්ගෙන, දේව වදන තුළ අප මීසමේ දරු දැරියන් පොහොණි කරමින්, දෙවිඳු මගට ඔවුන් යොමු කිරීමට අවැසි කැපවීම හා මග පෙන්වීම ලැබෙන ලෙස ඉල්ලමින් මෙම දිව්‍ය යාගයට සහභාගී වෙමු.

**ඇතුලුවීමේ ගීය** : කි.ගී අංක 2 : අහස ඔබේ

**පළමු කියවීම සඳහා හැඳින්වීම** : ඉසයියස් 55 : 6-9

දෙවියන් වහන්සේගේ සැළැස්ම මිනිසාගේ මනසින් තීරණය කළ නොහැක. උන්වහන්සේගේ සිතුවිලි වඩා උසස්ය. එබැවින්, දුෂ්ඨකම් අතහැර, දෙවිඳු වෙත හැරී එන්නට දිවැසිවර ඉසයියස් තුමා ගෙනෙන ආරාධනයට සවන් දෙමු.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගීය ගායනා කරන්න.

**දෙවන කියවීම සඳහා හැඳින්වීම**: පිලිප්පි 1 : 20-24, 27
ශු. පාවුලුතුමාගේ බලවත් ආශාවක් වූයේ, මෙලොව ජීවිතයෙන් පසු ක්‍රිස්තුන් වහන්සේ හා විසීමයි. නමුත්, සුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා ජීවත්වන්නට තම ආශාව ත්‍යාජ කිරීමට සූදානම් බව පිලිප්පිවරුන්ට ශු. පාවුලුතුමා යැවූ හසුන තුළින් පැහැදිළි කරයි.

**සාධුකාරය** : ආලේලූයියා /// සමිඳුන් නමින් වඩනා රජුට ආසිරි වේවා! ස්වර්ගයෙහි සාමයද, අති උසස් තන්හී මහිමයද වේවා! ආලේලූයියා //

**ශු. සුවිශේෂය** : මතෙව් 20 : 1-6

**විශ්වාසකයින්ගේ යැදුම්**

**පිළිතුර** : ස්වාමිනී අප කරන යාච්ඤා ඇසුව මැනව.

1. ආදර දෙව්පියාණනී, පැවිදි පූජක සැමගේ සහයෝගයෙන් ගොඩනැගෙන අප සභා මාතාව කාලයට අනුව නිවැරදිව තීරණ ගනිමින්, ජනතාව මෙහෙයවන්නට හැකිවනු පිණිස,

2. ආදර දෙව්පියාණනී, පොදු ජනතා සේවය සඳහා කැපවී සිටින ජන නායකයින් රටවැසි ජනතාවගේ දුක් වේදනා තේරුම් ගනිමින් අසාධාරණයට එරෙහිව නැගී සිටිමින්, සාමකාමී ලෙස සේවයේ යෙදීමට අවැසි මග පෙන්වීම ලැබෙන පිණිස,

3. ආදර දෙව්පියාණනී, මීසම තුළ සේවයේ යෙදී සිටින අප ඉදිරියේ කිතු සමිඳුන් හඳුනාගෙන, අන් අය හා ඒ අත්දැකීම් බෙදා ගනිමින්, මීසමේ නවෝදයක් ඇතිකරන්නට අපගේ කිතුණු කැඳවීම තේරුම් ගැනීමට හැකිවන පිණිස,

4. ආදර දෙව්පියාණනී, අදමිටු කමින් පිරී තිබෙන ලොවක දිවිගෙවන අපගේ දූදරුවන්ට ප්‍රේමයේ සහ පරිත්‍යාගයේ මාර්ගයේ ගමන් කරමින්, ඔබගේ ජීවිත මඟ ඔවුන් තුල ගොඩ නගන්නට කැපවී සිටින අප දහම් ගුරුවරු ගුරුවරියන් හට ශුද්ධාත්ම ආලෝකය ලැබෙන පිණිස,

**පඬුරු පිදීමේ ගීය** : කි.ගී. අංක 111- සියලු බලැති
**අනුභවයේ ගීය** : කි.ගී. අංක 180- කොපමණ රස වෙතිදෝ
**අවසාන ගීය** : කි.ගී. අංක 271- සාමයේ ජීවිත මග